මුදල් ප්‍රවාහ ප්‍රකාශන

LKAS 07

Presented by: Sadeepa Malshan
(BBA.MGT.SP.UNIVERSITY OF COLOMBO, AAT PASSED FINALISTS, DIP.IN.ENGLISH, DIP.IN.COMPUTERIZED ACCOUNTING, JMC LECTURER @ JMC GAMPAHA BRANCH AND JMC V LEARING LEACTURER @ HEAD OFFICE)

JMC vLearning
"your virtual learning partner"

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මගින්,

යම් දෙන ලද කාලච්ඡේදයක,

- මුදල් ගලා ඒම් සම්බන්ද තොරතුරු
- මුදල් ගලා යාම් සම්බන්ද තොරතුරු හා

එම මුදල් ප්‍රවාහයන්ගේ,

- මෙහෙයුම් ප්‍රතිඵලය
- අයෝජන ප්‍රතිඵලය
- මූල්‍ය ප්‍රතිඵලය ඉදිරිපත් කරයි

JMC VLearning
"your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ලාභය හා මුදල් ප්‍රවාහය අතර වෙනස්කම්

ගුණාංගය	ලාභය (උපචිත පදනම)	මුදල් ප්‍රවාහය (මුදල් පදනම)
නිර්වචනය	කාල පරිච්ඡේදයක් තුළ ආදායම්වලින් වියදම් අඩු කළ විට ලැබෙන ශුද්ධ ප්‍රතිඵලය පෙන්වන මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මිනුමකි.	මුදල් සහ මුදල් සමානතාවල ශුද්ධ චලනය පෙන්වන ද්‍රවශීලතාවේ මිනුමකි.
මිනුම් පදනම	ගනුදෙනු සිදු වූ විට හඳුනා ගැනේ	මුදල් ලැබෙන විට හෝ ගෙවන විට පමණක් හඳුනා ගැනේ.
කාලරාමුව	ආදායම උපයන විට හඳුනා ගැනේ වියදම් දරන විට හඳුනා ගැනේ.	ගනුදෙනු මුදල් හුවමාරු වන විට පමණක් වාර්තා කෙරේ.
වැදගත්කම	මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය පෙන්නුම් කරයි.	ණය ශක්‍යතාව, ද්‍රවශීලතාව, සහ මෙහෙයුම් සඳහා අරමුදල් සැපයීමේ හැකියාව පෙන්නුම් කරයි.

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මුදල් ප්‍රවාහ කළමනාකරණයේ වැදගත්කම

සැලසුම් සහ පුරෝකථනය



පාලනය සහ නිවැරදි කිරීම

නිරීක්ෂණය හා සංසන්දනය

JMC VLearning
"your virtual learning partner"

මුදල් ප්‍රවාහ වර්ගීකරණය



JMC vLearning
virtual learning partner
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයතනයේ ප්‍රධාන ආදායම් නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආයෝජන හෝ මූල්‍ය නොවන වෙනත් ක්‍රියාකාරකම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහ.

- භාණ්ඩ සහ සේවා සඳහා පාරිභෝගිකයින්ගෙන් ලැබෙන මුදල් ලැබීම්
- භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන්ට කරන මුදල් ගෙවීම්
- සේවකයින්ට සහ සේවකයින් වෙනුවෙන් කරන මුදල් ගෙවීම්
- මෙහෙයුම් වියදම් සඳහා මුදල් ගෙවීම් (කුලිය, උපයෝගිතා)
- ආදායම් බදු මුදල් ගෙවීම්

JMC vLearning
"your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ආයෝජන ක්‍රියාකාරකම්

දිගුකාලීන වත්කම් සහ මුදල් සමානතාවලට ඇතුළත් නොවන වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම සහ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ.

- දේපළ, පිරියත, සහ උපකරණ අත්පත් කර ගැනීමට කරන මුදල් ගෙවීම්
- දේ.පි.උ විකිණීමෙන් ලැබෙන මුදල් ලැබීම්
- වෙනත් ආයතනවල හිමිකම් හෝ ණය උපකරණ අත්පත් කර ගැනීමට කරන මුදල් ගෙවීම්
- දේ.පි.උ උපකරණ විකිණීමෙන් ලැබෙන මුදල් ලැබීම්
- වෙනත් පාර්ශ්වයන්ට දෙන ලද මුදල් අත්තිකාරම් සහ ණය

JMC vLearning "your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ආයෝජන ක්‍රියාකාරකම්

ආයතනයේ දායක වූ හිමිකම් සහ ණය ගැනීම්වල ප්‍රමාණය සහ සංයුතියේ වෙනස්කම්වලට තුඩු දෙන මුදල් ප්‍රවාහ.

- කොටස් නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් ආදායම
- කොටස් මිදීම සඳහා හිමිකරුවන්ට කරන මුදල් ගෙවීම්
- ණයකර, ණය, සහ බැඳුම්කර නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් ආදායම
- ණයට ගත් මුදල් ආපසු ගෙවීම්
- කල්බදු වගකීමක් අඩු කිරීම සඳහා කල්බදුකරුවෙකු විසින් කරන මුදල් ගෙවීම්

JMC vLearning
"your virtual learning partner"

අභ්‍යාස 01

ක්‍රියාකාරකම	මෙහෙයුම්	ආයෝජන	මූල්‍ය
අත්පිට විකුණුම්			
ණයගැති ලැබීම්			
ලාභාංශ ලැබීම්			
කොටස් නිකුතුවෙන් ලද මුදල්			
යන්ත්‍ර විකිණීමෙන් ලද මුදල්			
පොලී ලැබීම්			
පොලී ගෙවීම			
ණයහිමියන්ට ගෙවීම්			
බදු ගෙවීම			

JMC vLearning "your virtual learning partner"

අභ්‍යාස 01

ක්‍රියාකාරකම	මෙහෙයුම්	ආයෝජන	මූල්‍ය
ඉඩම් විකිණීමෙන් ලද මුදල්			
ලාභාංශ ගෙවීම			
ණය ගෙවීම			
අත්පිට ගැනුම්			
කොටස් මිල දී ගැනීම			
වැටුප් ගෙවීම			
කල්බදු වාරිකය තුළ වූ පොලිය			
කල්බදු දේපලෙහි මූලික ගෙවීම			
කල්බදු වාරික ගෙවීම			

JMC vLearning "your virtual learning partner"

මුදල් ප්‍රවාහ වර්ගීකරණය

මෙහෙයුම් ක්‍රයාකාරකම්	සෘජු ක්‍රමය හෝ වක්‍ර ක්‍රමය
ආයෝජන ක්‍රියාකාරකම්	සෘජු ක්‍රමය
මූල්‍ය ක්‍රියාකාරකම්	සෘජු ක්‍රමය

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම

යම් දෙන ලද කාලච්ඡේදයක,

- මුදල් ගලා ඒම් සම්බන්ද තොරතුරු
- මුදල් ගලා යාම් සම්බන්ද තොරතුරු හා

එම මුදල් ප්‍රවාහයන්ගේ,

- මෙහෙයුම් ප්‍රතිඵලය
- ආයෝජන ප්‍රතිඵලය
- මූල්‍ය ප්‍රතිඵලය ඉදිරිපත් කරයි

JMC vLearning
"your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ඍජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම

සීමිත ABC සමාගම

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

විස්තරය	රු. '000	රු. '000
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහයන්		
(+) අත්පිට විකුණුම්	xxx	
(-) අත්පිට ගැනුම්	(xx)	
(+) ණයගැති ලැබීම්	xxx	
(-) ණයහිමි ගෙවීම්	(xx)	
(-) පරිපාලන වියදම් ගෙවීම්	(xx)	
(-) බෙදාහැරීමේ වියදම් ගෙවීම්	(xx)	
(-) සේවකයින්ට අදාළ ගෙවීම් (වැටුප් / වේතන)	(xx)	
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්	**xxx**	
(-) පොලී ගෙවීම	(xx)	
(-) ආදායම් බදු ගෙවීම	(xx)	
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**xxx**

JMC vLearning "your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහ	
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(XXX)
උපකරණ විකිණීමෙන් ලැබෙන ආදායම	XXX
ලැබුණු පොලිය	XXX
ලැබුණු ලාභාංශ	XXX
ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිතා කළ ශුද්ධ මුදල්	**(XXX)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහ	
කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම	XXX
දිගුකාලීන ණය ගැනීම්වලින් ලැබෙන ආදායම	XXX
දිගුකාලීන ණය ගැනීම් ආපසු ගෙවීම	(XXX)
ගෙවන ලද ලාභාංශ	(XXX)
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ලැබෙන ශුද්ධ මුදල්	**XXX**
මුදල් සහ මුදල් සමානතාවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**XXX**
කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සමානතා	XXX
කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සමානතා	**XXX**

JMC vLearning "your virtual learning partner"

වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහ	
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	XXX
ගැලපීම්:	
ක්ෂයවීම සහ ක්‍රමක්ෂය	XXX
මූල්‍ය පිරිවැය	XXX
ආයෝජන ආදායම	(XXX)
වත්කම් බැහැර කිරීමේදී (ලාභය)/අලාභය	(XXX)/XXX
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්:	
වෙළඳ ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(XXX)/XXX
තොග (වැඩිවීම)/අඩුවීම	(XXX)/XXX
වෙළඳ ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	XXX/(XXX)
මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්	**XXX**
ගෙවන ලද පොලිය	(XXX)
ගෙවන ලද ආදායම් බදු	(XXX)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ශුද්ධ මුදල්	**XXX**

JMC vLearning "your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

අභ්‍යාසය

සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ පහත තොරතුරු ලබා දී ඇත.

<u>ආදායම් හා ගෙවීම්</u>

ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම් - රු. 1,500,000
සැපයුම්කරුවන්ට ගෙවූ මුදල් - රු. 850,000
සේවක වැටුප් ගෙවීම් - රු. 220,000
වෙනත් මෙහෙයුම් වියදම් ගෙවීම් - රු. 80,000
පොලී ගෙවීම් - රු. 20,000
ආදායම් බදු ගෙවීම් - රු. 50,000

<u>ආයෝජන ක්‍රියාකාරකම්</u>

නව යන්ත්‍රයක් මිලදී ගැනීම - රු. 200,000
පැරණි උපකරණයක් විකිණීමෙන් ලැබුණු මුදල් - රු. 40,000

<u>මූල්‍යකරණ ක්‍රියාකාරකම්</u>

සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් ලැබුණු මුදල් - රු. 300,000
ණයක් ආපසු ගෙවීම - රු. 100,000
ලාභාංශ ගෙවීම - රු. 60,000

අතිරේක තොරතුරු

වර්ෂයේ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ ශේෂය = රු. 150,000

JMC vLearning your virtual learning partner
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

අභ්‍යාසය

BLUE SKY (PVT) LTD සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ පහත මුදල් ගනුදෙනු ලබා දී ඇත.

ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම් - රු. 12,500,000
නව යන්ත්‍රයක් මිලදී ගැනීම - රු. 1,200,000
සේවක වැටුප් ගෙවීම - රු. 2,150,000
සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් මුදල් ලැබීම - රු. 2,000,000
සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම - රු. 7,300,000
දිගුකාලීන ණයක් ලබා ගැනීම - රු. 1,000,000
ආදායම් බදු ගෙවීම - රු. 280,000
පැරණි යන්ත්‍රයක් විකිණීමෙන් මුදල් ලැබීම - රු. 350,000
පරිපාලන වියදම් ගෙවීම - රු. 420,000
දිගුකාලීන ආයෝජනයක් මිලදී ගැනීම - රු. 600,000
පොලී ගෙවීම - රු. 150,000
ලාභාංශ ගෙවීම - රු. 450,000
විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ගෙවීම - රු. 500,000
ආයෝජනයක් විකිණීමෙන් මුදල් ලැබීම - රු. 250,000
ලැබුණු පොලී - රු. 70,000
බැංකු ණයක කොටසක් ආපසු ගෙවීම - රු. 600,000
ලැබුණු ලාභාංශ - රු. 40,000
අස්පර්ශනීය වත්කමක් (පේටන්ට්) මිලදී ගැනීම - රු. 300,000
නව ගොඩනැගිල්ලක් මිලදී ගැනීම - රු. 2,500,000
භාවිතයෙන් ඉවත් කළ උපකරණයක් විකිණීමෙන් මුදල් ලැබීම - රු. 180,000
බැංකු තැන්පතුවකින් ලැබුණු පොලී - රු. 25,000
අතිරේක තොරතුරු
2024 අප්‍රේල් 1 දින මුදල් හා මුදල් සමාන දෑ හි ශේෂය රු. 1,850,000 විය.
අවශ්‍යයි

LKAS 7 අනුව සෘජු ක්‍රමය භාවිතා කර 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරන්න.

JMC vLearning "your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

2016.03.31 සහ 2015.03.31 දිනයන්ට සීමිත නායගම් පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

විස්තරය	**2016.03.31 දිනට (රු.'000)**	**2015.03.31 දිනට (රු.'000)**
දේපළ, පිරියත සහ උපකරණ-ප්‍රත්‍යාගණිත වටිනාකමට	312	240
සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ	(72)	(40)
තොගය	184	104
වෙළෙඳ ලැබිය යුතු දෑ	80	120
අඩමාන ණය සඳහා වෙන් කිරීම....................................	(32)	(16)
මුදල්	192	–
මුළු වත්කම්	**664**	**408**
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය..................................	280	40
ප්‍රත්‍යාගණන සංචිත	56	16
රඳවාගත් ඉපැයුම්	32	96
දිගුකාලීන ණය	120	–
වෙළෙඳ ගෙවිය යුතු දෑ	136	144
ගෙවිය යුතු වැටුප්	40	32
බැංකු අයිරාව	–	80
මුළු වගකීම් සහ හිමිකම්	**664**	**408**

අතිරේක තොරතුරු:

(i) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ.

විස්තරය	**රු.'000**
විකුණුම්	120
විකුණුම් පිරිවැය	(80)
කොමිස් ආදායම (වර්ෂය අවසානයේ ලැබිය යුතු දෑ නොමැත.)	8
ලී බඩු විකිණීම මත ලාභය (එහි ධාරණ වටිනාකම රු. 40 000 ක් විය.) ...	16
අඩමාණ ණය	(16)
ක්ෂය	(40)
වැටුප්	(72)
වර්ෂයේ අලාභය	(64)

(ii) වර්ෂය තුළ දී දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇත. වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම් අත්පිට මුදලට සිදු කර ඇත.

(iii) වර්ෂය තුළ දී කොටස් නිකුතුවක් සිදු කර ඇති අතර 2016.03.31 දින වසර 3 ක කාලයක් සඳහා ණයක් ලබා ගෙන ඇත.

අවශ්‍යවන්නේ:

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත නායගම් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

කෙටි අභ්‍යාස

1. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරනු ලබන්නේ කුමන ගිණුම්කරණ ප්‍රමිතිය අනුවද?

1. LKAS 01
2. LKAS 37
3. LKAS 16
4. LKAS 07
5. SLFRS 15

JMC vLearning "your virtual learning partner"

කෙටි අභ්‍යාස

2. පහත සඳහන් කුමක් මෙහෙයුම් ක්‍රියාකාරකමක් වේද?

- යන්ත්‍රයක් මිලදී ගැනීම
- සාමාන්‍ය කොටස් නිකුත් කිරීම
- ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම
- ණයක් ලබා ගැනීම

JMC VLearning "your virtual learning partner"

කෙටි අභ්‍යාස

3. පහත සඳහන් කුමක් ආයෝජන ක්‍රියාකාරකමක් වේද?

- ගොඩනැගිල්ලක් මිලදී ගැනීම
- වැටුප් ගෙවීම
- බදු ගෙවීම
- සැපයුම්කරුවන්ට ගෙවීම

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

කෙටි අභ්‍යාස

4. පහත සඳහන් කුමක් මූල්‍යකරණ ක්‍රියාකාරකමක් වේද?

- ආයෝජනයක් විකිණීම
- සාමාන්‍ය කොටස් නිකුත් කිරීම
- ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම
- වැටුප් ගෙවීම

කෙටි අභ්‍යාස

5. සෘජු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ,

- ලාභයෙන් ආරම්භ කිරීමයි.
- සත්‍ය මුදල් ලැබීම් හා ගෙවීම් පෙන්වීමයි.
- ක්ෂයවීම් එකතු කිරීමයි.
- කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමයි.

JMC vLearning "your virtual learning partner"

කෙටි අභ්‍යාස

6. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑහි අවසාන ශේෂය සමාන විය යුත්තේ,

- ආදායම් ප්‍රකාශනයේ ලාභයට
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් ශේෂයට
- විකුණුම් වටිනාකමට
- ශුද්ධ වත්කම්වලට

කෙටි අභ්‍යාස

7. දිගුකාලීන ණයක් ලබා ගැනීම අයත් වන්නේ,

- මෙහෙයුම් ක්‍රියාකාරකම්
- ආයෝජන ක්‍රියාකාරකම්
- මූල්‍යකරණ ක්‍රියාකාරකම්
- ඉහත කිසිවක් නොවේ

කෙටි අභ්‍යාස

8. පහත සඳහන් කුමක් මුදල් ප්‍රවාහයක් නොවේද?

- ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම
- සැපයුම්කරුවන්ට ගෙවීම
- ක්ෂයවීම්
- බදු ගෙවීම

JMC vLearning "your virtual learning partner"

කෙටි අභ්‍යාස

9. පැරණි යන්ත්‍රයක් විකිණීමෙන් ලැබුණු මුදල් වර්ගීකරණය කරන්නේ,

- මෙහෙයුම් ක්‍රියාකාරකම්
- ආයෝජන ක්‍රියාකාරකම්
- මූල්‍යකරණ ක්‍රියාකාරකම්
- මුදල් ප්‍රවාහයක් නොවේ

JMC vLearning "your virtual learning partner"

කෙටි අභ්‍යාස

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ වන්නේ,

- ව්‍යාපාරයේ ලාභය පමණක් පෙන්වීම
- කාලසීමාවක මුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ තොරතුරු සැපයීම
- කොටස් හිමියන්ගේ කොටස් පමණක් පෙන්වීම
- බදු ගණනය කිරීම

JMC vLearning "your virtual learning partner"

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙළ කිරීම

මෙහිදී ව්‍යාපාරයේ ලාභය මුදල් ප්‍රවාහය බවට පරිවර්ථනය කිරීමක් සිදු වන අතර එය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල පමණක් සිදු කරනු ලබයි.එහි දී අදාල වන ගැලපුම් කිහිපයකි.

- බදු පෙර ලාභය ගණනය කිරීම
- මුදල් ප්‍රවාහයක් නොවන අයිතම ගැලපීම
- මෙහෙයුම් නොවන ක්‍රියාකාරකම් ගැලපීම
- පොලී හා පාරිතෝශික ගැලපීම
- කාරක ප්‍රග්ධනය ගැලපීම

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

බදු පෙර ලාභය ගණනය කිරීම

යම් ගැටලුවක බදු පෙර ලාභය දී නොමැති අවස්ථාවක එය දී ඇති දත්ත මගින් ගණනය කරගත යුතුවේ. මෙය රඳවාගත් ඉපයුම් ගිනුම භාවිතයෙන් ගණනය කරගත හැක.

රඳවාගත් ඉපයුම් ගිණුම

සංචිත මාරු කිරීම්	xxx	ආරම්භක ශේෂය	xxx
සංචිත ප්‍රාග්ධනීත කිරීම්	xxx	වසරේ ලාභය	xxx
ලාභාංශ ගෙවීම්	xxx		
ශේෂය ප/ගේ	xx		
	xxx		xxx
		ශේෂය ඉ/ගේ	xx

JMC vLearning "your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මුදල් ප්‍රවාහයක් නොවන අයිතම ගැලපම

සමහර අයිතම මුදල් ප්‍රවාහයක් නොවූවත් ලාභය තුල ගැලපුම් වී තිබිය හැක. එවැනි අයිතම මුදල් ප්‍රවාහයට අදාල නොවන බැවින් ඒවා ලාභය ප්‍රති ගැලපුම් කල යුතුය. ලාභයෙන් ඉවත්කරගත යුතුය.

- ක්ෂය වියදම්
- අඩමාණය ණය වියදම්
- වන්දි වියදම්
- ප්‍රත්‍යාගණය අලාභ
- විනිමය මුදල් හුවමරු අලාභ
- හානිකරණ වියදම්

JMC vLearning "your virtual learning partner"

මෙහෙයුම් නොවන ක්‍රියාකාරකම් ගැලපුම

මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල ඇති ලාභය තුල මෙහෙයුම් ක්‍රියාකාරම් තුලට අදාල නොවන අයිතම ඇතුලත් වේ. එවැනි අයිතම ඇත්නම් ඒවා මෙහෙයුම් ක්‍රියාකරම් තුලින් ඉවත්කොට ඒවා ඊට අදාල ක්‍රියාකාරකම් තුල ඇතුලත් කල යුතුය.

- ආයෝජන මත පොළී අදායම්
- ස්ථාවර වත්කම් මත පොළී අදායම්
- කොටස් මිලදී ගැනීම මත ලද ලාභාංශ
- දුන් ණය මත පොළී අදායම්
- වත්කම් විකුණුම් මත ලද ලාභ

පොල හා පාරිතෝෂික ගැලපම

පොලී වියදම් ගෙවීම් හා පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල වෙනමම ගෙවීමක් ලෙස වාර්ථා කල යුතුය. එවැනි අයිතම වල වර්ෂයට අදාල කොටස දැනටමත් ගැලපුම් වී තිබීම නිසා එය වර්ශයට අදාල කොටස ලාභයෙන් ඉවත්කොට ගෙවූ ප්‍රමාණය පමණක් වෙනමම නිරූපණය කල යුතුය.

- අදාල වියදම +
- ගෙවූ වියදම -

JMC vLearning "your virtual learning partner"

කාරක ප්‍රාග්ධනය ගැලපම

අයිතමය	ජංගම වත්කම්	ජංගම වගකීම්
වැඩිවීම	මුදල් ගලා යාමකි	මුදල් ගලා ඒමකි
අඩුවීම	මුදල් ගලා ඒමකි	මුදල් ගලා යාමකි

JMC vLearning
"your virtual learning partner"

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

සීමාසහිත Sun (පෞද්ගලික) සමාගමේ 2026 මාර්තු 31 දිනට සහ 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත Sun (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	2026	2025
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	24,900	22,400
සමුච්චිත ක්ෂය	(5,400)	(4,200)
ධාරණ අගය	**19,500**	**18,200**
ජංගම වත්කම්:		
තොග	6,800	6,100
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	6,400	6,000
මුදල් සහ මුදල්වලට සමාන දෑ	2,100	1,900
	15,300	**14,000**
මුළු වත්කම්	**34,800**	**32,200**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	25,000	25,000
රඳවාගත් ඉපැයීම්	4,200	3,200
	29,200	**28,200**
ජංගම නොවන වගකීම්:		
දිගුකාලීන ණය	2,300	1,100
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	450	380
	2,750	**1,480**
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	1,900	1,620
ගෙවිය යුතු ආදායම් බදු	950	900
	2,850	**2,520**
මුළු ස්කන්ධය සහ වගකීම්	34,800	32,200

JMC vLearning
"your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පසු ලාභය රු.1,200,000/- ක් විය.

(2) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.450,000/- ක් විය.

(3) වර්ෂය තුළදී, පිරිවැය රු.4,000,000/-ක යන්ත්‍රයක් රු.1,800,000/- කට විකුණනු ලැබූ අතර, ඉවත් කළ දිනට එහි සමුච්චිත ක්ෂය වීම රු.1,900,000/- ක් විය. තවද, වර්ෂය තුළදී නව යන්ත්‍රයක් මිලට ගනු ලැබීය.

(4) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහාණය මත පොළී වියදම රු.175,000/- ක් වූ අතර, වර්ෂය තුළදී සියළු පොළී ගෙවීම් සිදුකොට ඇත. වර්ෂය තුළදී ණය මත ප්‍රාග්ධන ආපසු ගෙවීම් සිදු කොට නොමැති අතර, අළුතෙන් ණය මුදලක් වර්ෂය තුලදී ලබාගෙන ඇත.

(5) වර්ෂය තුළදී පාරිතෝෂික ගෙවීම් රු.250,000/- ක් විය.

(6) 2026 මාර්තු 31 දින සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

සීමාසහිත Emelie **(පෞද්ගලික) සමාගමේ** 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත Emelie (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	2025	2024
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	138,690	136,420
සමුච්චිත ක්ෂය	(127,930)	(109,730)
ධාරණ අගය	**10,760**	**26,690**
ජංගම වත්කම්:		
තොග	258,700	208,710
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	54,730	148,760
මුදල් සහ මුදල්වලට සමාන දෑ	269,709	161,083
	583,139	**518,553**
මුළු වත්කම්	**593,899**	**545,243**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	300,000	250,000
රඳවාගත් ඉපැයීම්	49,013	28,763
	349,013	**278,763**
ජංගම නොවන වගකීම්:		
බැංකු ණය	90,790	127,600
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	20,470	19,460
	111,260	**147,060**
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	124,376	101,400
ණය මත ගෙවිය යුතු පොලිය	5,470	13,800
ගෙවිය යුතු ආදායම් බදු	3,780	4,220
	133,626	**119,420**
මුළු ස්කන්ධය සහ වගකීම්	**593,899**	**545,243**

JMC vLearning
"your virtual learning partner"

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම රු.3,250,000/- කි. සමාගමේ ණය පොළී සහ බදු පෙර ලාභය රු.25,500,000/- ක් වේ.

(2) 2024 සැප්තැම්බර් 30 දින, මෝටර් රථයක් රු. මිලියන රු. 5.5 කට විකුණන ලදී. මෝටර් රථයේ පිරිවැය රු. මිලියන 6 ක් වු අතර, 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 3.75 ක් විය. මෝටර් රථ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට වසර 5 ක් පුරා ක්ෂය කරනු ලබයි. එම ඉවත් කරන ලද මෝටර් රථය වෙනුවට 2024 ඔක්තෝම්බර් 01 දින, නව රථයක් මිලට ගත් අතර, එය එදිනම ප්‍රාග්ධනිත කරන ලදී.

(3) වර්ෂය සඳහා වන ණය මත පොළී වියදම රු.2,000,000/- ක් වන අතර, වර්ෂය තුළදී සමාගම විසින් රු.7,500,000/-ක නව ණය මුදලක් ලබාගන්නා ලදී.

(4) වර්ෂය සඳහා වන පාරිතෝෂික වෙන්කිරීම රු.1,100,000/- ක් වේ.

(5) වර්ෂය තුළදී, සමාගම විසින් එහි දැනට සිටින කොටස්හිමියන් වෙත නව කොටස් නිකුතුවක් සිදුකරන ලදී.

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගමේ 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	2025	2024
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	220,400	156,930
සමුච්චිත ක්ෂය	(129,100)	(101,460)
ධාරණ අගය	**91,300**	**55,470**
ජංගම වත්කම්:		
තොග	106,420	157,439
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	110,426	97,830
මුදල් සහ මුදල්වලට සමාන දෑ	15,400	8,900
	232,246	**264,169**
මුළු වත්කම්	**323,546**	**319,639**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 12,800,000)	128,000	128,000
රඳවාගත් ඉපැයීම්	125,596	114,939
	253,596	**242,939**
ජංගම නොවන වගකීම්:		
බැංකු ණය	30,400	31,400
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	21,480	26,700
	51,880	**58,100**
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	5,400	420
බැංකු ණය	2,000	11,500
ගෙවිය යුතු ණය පොලිය	7,430	1,040
ගෙවිය යුතු ආදායම් බදු	3,240	5,640
	18,070	**18,600**
මුළු ස්කන්ධය සහ වගකීම්	**323,546**	**319,639**

JMC vLearning
"your virtual learning partner"

මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම රු.3,400,000/- කි. සමාගමේ පොළී සහ බදු පෙර ලාභය රු.23,437,000/- ක් වූ අතර සාමාන්‍ය කොටස්කරුවන් සඳහා අතුරු ලාභාංශ 2024 දෙසැම්බර් 31 දින ගෙවා ඇත.

(2) 2024 ඔක්තෝම්බර් 01 දින, යන්ත්‍රයක් රු. මිලියන රු. 9.5 කට විකුණන ලදී. යන්ත්‍රයේ පිරිවැය රු. මිලියන 15 ක් වූ අතර, 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 7.5 ක් විය. යන්ත්‍ර පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට වසර 10 ක් පුරා ක්ෂය කරනු ලබයි. එම විකුණූ යන්ත්‍රයට ප්‍රතිස්ථාපනයක් වශයෙන්, 2025 මාර්තු 31 දින නව යන්ත්‍රයක් මිලට ගත් අතර, එය එදිනම ප්‍රාග්ධනිත කරන ලදී.

(3) වර්ෂය සඳහා වන පොළී වියදම රු.8,100,000/- ක් වන අතර, වර්ෂය තුළදී සමාගම විසින් රු.10,000,000/- ක නව බැංකු ණය මුදලක් ලබාගන්නා ලදී.

(4) වර්ෂය සඳහා වන පාරිතෝෂික වෙන්කිරීම රු.1,750,000/- ක් වේ.

JMC vLearning
"your virtual learning partner"